**අනුරාධපුර මහා නගර සභාව - 2023**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අනුරාධපුර මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (i) | අංක 3.15 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශන තුළ එහි නෛතික ස්වරූපය, එහි අධිකාරිය ඇති ප්‍රදේශය, එහි අධිකාරිය ඇති ප්‍රදේශය පිහිටා ඇති රට සහ පළාත එහි ප්‍රධාන කාර්යාලයේ ලිපිනයන් සහ අස්ථිත්වයේ මෙහෙයුම් පිළිබඳව විස්තරයක් සහ එහි ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව සටහන් තුළින් හෙළිදරව් කර නොතිබුණි. | සටහන් අංක 10 යටතේ සභාවේ සාමාන්‍ය තොරතුරු සඳහන් කර ඇත. ඉදිරි මූල්‍ය වර්ෂයේදී සවිස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 16.7 ඡේදය ප්‍රකාරව වාර්තා කරන කාලපරිච්ඡේදය සඳහා සභාව සැලසුම් කළ කාර්යයන්, එහි සත්‍ය තොරතුරු සහ පූර්ව කාලපරිච්ඡේදයට අදාළ එම සත්‍ය තොරතුරු ද සමඟ සන්සන්දනාත්මකව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ විස්තර ඉදිරිපත් කරන බව. | -එම- |
| (iii) | ප්‍රමිත අංක 16.10 ප්‍රකාරව සේවා කාර්යසාධනයට අදාළ විශ්ලේෂණාත්මක තොරතුරු සංක්ෂිප්තව ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයට අදාළ හිඟ කසළ ගාස්තු ආදායම රු.2,715,100 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.1,172,900 ක් ලෙස අඩුවෙන් සඳහන් කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂයේදී රු.1,497,160 ක් වියදම් කර ඉදිකරන ලද පුබුදුපුර 20 පටුමඟ කුට්ටිගල් පාර සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ සඳහන් ව්‍යාපෘති 34 කට අදාළ රු.29,006,795 ක ණයගැති හා ණයහිමි ශේෂ වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සුනාත විශ්‍රාම ශාලාව නවීකරණය සඳහා 2022 වර්ෂයේදී රු.8,832,446 ක් වියදම් කිරීම දෙවරක් ගිණුම්ගත කිරීම නිසා ප්‍රාග්ධන වත්කම් රු.8,832,446 කින් වැඩිවී තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි වත්කම් වැඩිවීම් රු.7,229,059 ක් මාර්ග හා බෝක්කු ඉදිකිරීම් ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | -එම- | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කළ ව්‍යාපෘති 02 කට අදාළ රු.18,881,977 ක් පුනරාවර්තන අයභාර ලෙස සමාලෝචිත වර්ෂයේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ද දක්වා තිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | මහා නගර සභාවට අයත් රු.30,093,456 ක ස්ථාවර තැන්පතු 14 ක් ආයෝජන ලෙස දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි. | -එම- | ආයෝජන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් හා උපලේඛන අතර හිඟ වරිපනම්වල රු.889,533 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අනුරූපී වාර්තා උපලේඛන සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | ආදායම් විෂයයන් 03 කට සහ වත්කම් විෂයයන් 02 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.105,826,139 ක් වූ අතර, ඊට අදාළ ලේඛන හා උපලේඛන අනුව එම වටිනාකම රු.104,614,196 ක් වූයෙන් රු.1,211,943 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| | **රු.** | | | |
| මාර්ග ඉදිකිරීම් | 26,954,750 | (i) ඇස්තමේන්තු<br>(ii) වැඩ සහතික කිරීම් ගොනු<br>(iii) ඉතිරි අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ තහවුරු කෙරෙන සාක්ෂි විගණනය කරන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දේශීය ආදායම් කොමසාරිස්ගේ 2023 අප්‍රේල් 06 දිනැති අංක SEC/2023/E/02 දරන චක්‍රලේඛය | සභාවේ නාගරික කොමසාරිස්ගේ 2023 වර්ෂයේ උපයනවිට බදු රු.219,162 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. | ඉදිරියේදී සමස්ත ආදායම අනුව උපයනවිට බදු අයකිරීමටත් හිඟ මුදල් ගෙවීමටත් කටයුතු කරන බව. | චක්‍රලේඛයට අනුකූලව උපයනවිට බදු ගණනය කර අයකර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.108,130,062 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.34,570,337 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 117,581,041 | 83,406,370 | 105,579,178 | 88,745,511 | 119,962,000 | 78,121,540 | 79,929,199 | 110,918,319 |
| (ii) | කුලී | 112,317,934 | 108,455,998 | 99,015,753 | 78,496,365 | 82,273,038 | 78,236,585 | 67,730,749 | 69,056,120 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 29,979,000 | 39,056,035 | 36,408,041 | 8,903,373 | 32,413,000 | 29,192,086 | 36,658,002 | 6,255,379 |
| (iv) | වෙනත් ආදායම් | 160,345,351 | 207,532,842 | 123,003,729 | 112,360,175 | 94,265,600 | 122,695,556 | 119,149,240 | 27,831,062 |
| | | 420,223,326 | 438,451,245 | 364,006,701 | 288,505,424 | 328,913,638 | 308,245,767 | 303,467,190 | 214,060,880 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | 2023 වර්ෂය සඳහා රු.77,452,555 ක වරිපනම් බදු ආදායමක් රැස් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද නමුත් 2023 දෙසැම්බර් 31 වනවිට රු.47,388,718 ක් පමණක් අයකරගෙන තිබුණි. | ක්ෂේත්‍රයේ වරිපනම් අයකර ගැනීම සඳහා ඉලක්ක නියම කිරීම, නෛතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කර ඇති බව. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.88,745,571 ක හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252(i)(අ) වගන්තිය ප්‍රකාරව නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | බල ප්‍රදේශයේ දේපළ තහනම් කිරීමේ නිවේදන 926 ක් නිකුත් කර ඇති අතර, ඒ අනුව සැලකිය යුතු හිඟ මුදලක් අයකරගෙන ඇති බව. | -එම- |
| (ආ) | **කුලී** | | |
| (i) | 2021 වර්ෂයට අදාළව අයවිය යුතු වාහන කුලී ආදායම් රු.158,160 ක් 2023 වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | මහා නගර සභාව සතු කඩ කාමර 511 කට අදාළ වසර 01 ත් 08 ත් කාලයක සිට පවතින හිඟ කුලී රු.66,719,780 ක් සහ පොදු වෙළෙඳ සැල කඩ කාමර 210 ක් වෙනුවෙන් අයවිය යුතු කුලී රු.8,821,505 ක් වසර 01 ත් 08 ත් අතර කාලයක සිට අයවී නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා අවසන් නිවේදන 28 ක් වාස බද්ධ නිවේදන 20 ක් හා විනිග්‍රහන බලපත්‍ර 09 ක් නිකුත් කර ඇති බව. | හිඟ කුලී අයකරගත යුතුය. |
| (iii) | වත්කම් බදුදීම වෙනුවෙන් අයවිය යුතු හිඟ කුලී රු.1,967,718 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | වත්කම් බදුදීම් හිඟ කුලී අයකරගත යුතුය. |
| (iv) | මහා නගර සභාව සතු ඉඩම් වගා කටයුතු සඳහා බදුදීම් වෙනුවෙන් අයවිය යුතු රු.632,025 ක් අයවී නොතිබුණි. | -එම- | අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර බිල්කිරීම රු.14,004,410 ක් වූ නමුත් එයින් වෙළඳ බලපත්‍ර 1343 කට අදාළ රු.7,194,633 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ආදායමෙන් සියයට 75 ක් මේ වනවිට අයකරගෙන ඇති බව. | බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,823,329 ක් හා මුද්දර ගාස්තු රු.50,062,750 ක් අයකරගෙන නොතිබුණි. | උසාවි දඩ මුදලින් ඇස්තමේන්තු පදනම අනුව ගිණුම්ගත කර ඇති අතර, මුද්දර ගාස්තු සඳහා ඔප්පු ලේඛන ලබාදී නොමැති බව. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 32 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 වර්ෂයේදී ද අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට ක්‍රියාකළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| මහා නගර සභාවට අදාළව ඉකුත් වර්ෂවලදී සිදුවී තිබුණු රු.56,425,174 ක වංචා හා පාඩු වෙනුවෙන් විනය පරීක්ෂණ හා අවශ්‍ය නීතිමය කටයුතු සිදුකර නොතිබුණි. | මෙයට ඇතුළත් කාරණා 02 ක් සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පවත්වා විනය නියෝග ක්‍රියාත්මක කර ඇත. ඉතිරි කාරණා සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව. | විනය පරීක්ෂණ පවත්වා එම නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ 40(1) (ආ) වගන්තිය වැරදි ලෙස අර්ථකථනය කරමින් වරිපනම් නාම සංශෝධන ආදායම් වෙනුවෙන් රු.279,500 ක් දිරිදීමනා ගෙවා තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර ඇති බව. | දිරිදීමනා ගෙවීමට සිදුනොවන පරිදි සාමාන්‍ය රාජකාරි කාලය තුළ කාර්යයන් සිදු කළ යුතුය. |
| (ආ) | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවට අයත් වටිනාකම රු.3,498,179 ක් වූ ව්‍යාපෘති 07 ක් සභාවේ මානව සහ භෞතික සම්පත් යොදාගෙන සභාව විසින් ප්‍රජා මණ්ඩල වෙත කොන්ත්‍රාත් ලබාදී තිබුණු නමුත් ඒ වෙනුවෙන් සභාවට කිසිදු ප්‍රතිලාභයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් පරිදි ගිවිසුම්ගත වී මෙම ව්‍යාපෘති සිදුකර ඇති බව. | සභාවට ප්‍රතිලාභ නොමැතිව මෙවැනි කාර්යයන් සිදු නොකිරීමට වගබලාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2023 පොසොන් පොහොයට සමගාමීව පවත්වන ලද 2023 පුරවර උදානය වෙනුවෙන් අනුරාධපුර මහා නගර සභාව විසින් වෙළෙඳ බිම් කොටස් 416 ක් බදු දීමේදී උපරිම සීමාවකින් තොරව වෙළෙඳ බිම් කොටස් මිලදී ගැනීමට අවස්ථාව ලබාදීම නිසා වෙළඳ බිම් කොටස් 30 සහ 20 බැගින් ලබාගත් පුද්ගලයින් එම බිම් කොටස් අතුරු බදුදී රු.1,847,639 ක අසාමාන්‍ය ලාභයක් උපයාගෙන තිබුණු නමුත් මෙම තත්ත්වයන් පාලනය කිරීම සඳහා අවධානය යොමුකර නොතිබුණි. | සීමා කිරීමකින් තොරව ඉහළම ලංසුවට වෙළඳ බිම් කොටස් ලබාදී ඇති බව. | අපක්ෂපාතීව සහ විනිවිදභාවයෙන් කටයුතු කිරීමටත් කිසියම් පාර්ශවයකට අසාධාරණයක් සිදු නොවන පරිදි කටයුතු කිරීමටත් අවධානය යොමු කළ යුතුය. |
| (ඉ) | 2023 පුරවර උදානය වැඩසටහන ආදායම් උත්පාදනය පමණක් පදනම් කරගෙන ක්‍රියාත්මක කිරීම නිසා වෙළඳ ප්‍රජාවට, බල ප්‍රදේශයේ ජනතාවට සමාන සහ සාධාරණ අවස්ථා අහිමිවී තිබුණු බවට එම දිනවලදී වෙළඳ කුටි ආශ්‍රිතව සිදුකරන ලද විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය. | ආදායම් උත්පාදනය අරමුණු කරගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති බව. | සැමට සමාන අවස්ථා ඇති වන පරිදි ක්‍රියාකළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | මුද්දර ගාස්තුවලට අදාළ ලේඛනගත කිරීම හා ලිපි සැකසීම පමණක් පදනම්ව 2018, 2019, 2020, 2021 වර්ෂවල ලැබී තිබුණු රු.159,930,267 ක මුද්දර ගාස්තු ආදායම් වලින් රු.942,037 ක දිරි දීමනා අධීක්ෂණ නිලධාරීන් 04 දෙනෙකු වෙත ගෙවා තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 188(1) වගන්තිය අනුව මෙම දීමනා ගෙවා ඇති බව. | චක්‍රලේඛය අනුව ක්‍රියාකළ යුතු අතර එම කාර්යය වෙනුවෙන් සෘජු දායකත්වයක් නොදක්වන නිලධාරීන්ට දිරි දීමනා නොගෙවීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | ඔප්පු පරීක්ෂා කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පූර්ණ කාලීනව පත්කර මහා නගර සභාවේ අරමුදලින් 2018 වර්ෂයේ සිට 2021 දක්වා කාලයේදී ඔවුන්ට රු.1,956,154 ක වැටුප් ලෙස ගෙවා තිබියදී මුද්දර ගාස්තු ආදායමෙන් ද දිරි දීමනා ලෙස රු.1,011,761 ක් ද ගෙවා තිබුණි. | මෙම කටයුතු අමතර රාජකාරියක් ලෙස පවරා ඇති බව. | වැටුප ගෙවන බැවින් දිරිදීමනා නොගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අනුරාධපුර මහා නගර සභාවට අයත් නිල නිවාසයකින් සභාවට අයවිය යුතු හිඟ කුලී රු.11,231,838 ක් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරයා සමඟ සාකච්ඡා කර ඉදිරියේදී තීරණ ගැනීමට කටයුතු කරන බව. | හිඟ කුලී අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල පියවරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අනුරාධපුර මහා නගර සභාවට අයත් එළදා බදු දියහැකි ඉඩම් අක්කර 30.75 ක් සම්බන්ධයෙන් බදු ගිවිසුම් යාවත්කාලීන කර නියමිත ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | ලේඛන සකස් කිරීමට කටයුතු කර ඇති අතර හිඟ මුදල් අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත. | අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන භාණ්ඩාගාර ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (අ) ඡේදය පරිදි භාවිතයෙන් ඉවත් කර වසර 10 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණු වැන් රථයක් සහ වටිනාකම සොයා ගැනීමට නොහැකි වැන් රථයක්, කැබ් රථයක් සහ ගිනි කැබ් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉංජිනේරු නිර්දේශ ලබාගැනීමට යොමුකර ඇති බව. | අපහරණය කටයුතු සිදුකළ යුතුය. |
| (ආ) | මහා නගර සභාව සතු බදු දිය හැකි වත්කම් 17 ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.2,515,401 ක් අයකරගෙන නොතිබුණු අතර මුදල් නොගෙවන පාර්ශව වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සහ එම වත්කම් පවරාගෙන වෙනත් පාර්ශව වෙත බදුදීමට තිබෙන අවස්ථාවද ගිවිසුම් නොමැතිවීම නිසා සභාවට අහිමිවී තිබුණි. | මුදල් නොගෙවන බදුකරුවන් වෙත නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් පවතින බව. | අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | අලුත්වැඩියා නොකිරීම නිසා වාහන 09 ක් නිෂ්කාර්යව තිබුණි. | අමතර කොටස් සොයා ගැනීමට හැකි වූ පසු අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | සභාව භාවිතා කරමින් පවතින වාහන 09 ක් සභාවේ නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමෙන් පසු ලියාපදිංචි කිරීමට කටයුතු කරන බව. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | 2023 පුරවර උදානය සඳහා වූ වෙළෙඳ බිම් කොටස් වෙනුවෙන් ලංසු මිල ගණන් ලැබී නොතිබුණු ස්ථාන 36 ක් ප්‍රසිද්ධ වෙන්දේසියට ඉදිරිපත් නොකර විනිවිදභාවයකින් තොරව පුද්ගලයන් වෙත ලබාදී අනුරාධපුර මහා නගර සභාව රු.2,955,983 ක ආදායමක් ලබාගෙන තිබුණි. | ආදායම් උත්පාදනය පමණක් අරමුණු කරගෙන ක්‍රියාත්මක කර ඇති බව හා ප්‍රජාවගේ ඉල්ලීම් ඉටු නොකරන ලද බවට පැමිණිලි ලැබී නොමැති බව. | විනිවිදභාවයෙන් කටයුතු සිදුවන බවට තහවුරු කළ යුතුය. |
| (ආ) | 2023 පුරවර උදානය වෙනුවෙන් මාර්ගය දෙපස හා ක්‍රීඩාංගණවල රථගාල් 05 ක් බදුදී තිබුණු නමුත් ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | රථගාල් නගර සභා භූමියක් නොවන බැවින් ප්‍රසම්පාදන සිදුකර නොමැති අතර ඉදිරි වර්ෂයේදී ප්‍රසම්පාදන සිදුකරන බව. | ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය. |